**2021.02.15**

ප්‍රිය ශිෂ්‍යය/ශිෂ්‍යාව

රුහුණ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ කළමනාකරණ උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා 2019/2020 ප්‍රවේශ වර්ෂයට අදාලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ඔබ ලියාපදිංචි කර ඇත.

**ඒ අනුව, නවක සිසුන් ඇතුලත් කර ගැනීමේ කටයුතු සඳහා 2021.02.22 දින පැවැත්වේ. ඔබ විසින් එම කර්තව්‍යය සඳහා පහත දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලයට පැමිණිය යුතුය.**

ඔබ රුහුණ විශ්වවිද්‍යාලයේ රබීන්ද්‍රනාත් තාගෝර් ශ්‍රවණාගාරය වෙත වාර්තා කල යුතුය.

| | සිසුන් ඇතුලත් කර ගැනීම | උපකුලපති තුමාගේ දේශනය |
|---|---|---|
| **Group A** | පෙ.ව 8.00 සිට පෙ.ව. 11.00 | පෙ.ව 11.00 සිට මධ්‍යාහ්න 12.30 |
| **Group B** | මධ්‍යාහ්න 12.00 සිට ප.ව. 3.00 | ප.ව.3.00 සිට ප.ව.4.30 |

විශ්වවිද්‍යාල භූමියට ඇතුල් වීම සඳහා **ඔබගේ ජාතික හැඳුනුම්පත** හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලද ලිපිය ප්‍රධාන පිවිසුම් දොරටුවේ ආරක්ෂක අංශය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**රජයේ සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් වලට අනුව මෙම ක්‍රියාවලිය සිදුවන බැවින් ඔබ විසින් එම උපදෙස් තරයේ පිළිපැදිය යුතුය. ඔබ සමඟ පැමිණිය හැක්කේ තවත් එක් අයකුට පමණක් (මව/පියා/භාරකරු) බව තරයේ අවධාරණය කරනු ලැබේ.**

ඔබ විසින් විශ්වවිද්‍යාලය වෙත පැමිණීමේදී පහත ලියකියවිලි රැගෙන පැමිණිය යුතුවේ.

1. ජාතික හැඳුනුම්පත
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔබ වෙත එවන ලද ලිපිය
3. සෙ.මී. 3.5 x 4.5 ප්‍රමාණයේ වර්ණ ඡායාරූප අටක් දක්වා ඇති ශිෂ්‍ය අංකය හා ඔබගේ උසස් පෙළ අංකය සඳහන් කරනු ලැබූ ලියුම් කවරයක විශ්වවිද්‍යාලය වෙත රැගෙන ආ යුතුය. **(සෑම ඡායාරූපයකම පිටුපස ජාතික හැඳුනුම්පත් අංකය, අ.පො.ස.(උ.පෙ.) විභාග අංකය යොදා තම ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී/ පාසලේ විදුහල්පති ලවා සහතික කර තිබිය යුතුය.)**
4. ඔබ විසින් රු.900/- ක මුදලක් පහත දැක්වෙන ගිණුම් අංකයට බැරකර අදාල රිසිට් පත.
   "University of Ruhuna Collection Account" 201021800000021 (මහජන බැංකුව ඕනෑම ශාඛාවක්)

සහකාර ලේඛකාධිකාරී
ශිෂ්‍ය කටයුතු අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍ය කටයුතු

**විමසීම: 0412222681 දිගුව 2134/2135**